# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | ඉතිහාසය | 5 ඒකකය |
|---|---|---|

### ශ්‍රී ලංකාවේ පැරණි විද්‍යාව හා තාක්‍ෂණය

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. විද්‍යාත්මක අවස්ථාවල මුල් අවස්ථාවකි,
    (1). මහ වැව් ඉදිකිරීම
    (2). මැටි ඔරු සුසාන
    (3). යකඩ නිස්සාරණය
    (4). ගෘහනිර්මාණ ශිල්පය

02. පීඩක ශල්කනය යනු,
    (1). මැටි නලයක් සවිකර දහනය සඳහා ඔක්සිජන් වායුව ලබා ගැනීමයි.
    (2). උඳුනක දහයියා පුළුස්සා ගැනීමය.
    (3). වෙර යොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවා මෙවලම් තැනීමේ තාක්‍ෂණය.
    (4). මැටි ජලයේ දිය කොට කුඩා අංශු අවලම්බනය කිරීමය.

03. මැටිඔරු සුසාන ගර්භ ඉදිකර තිබෙන්නේ,
    (1). මියගිය අය ආදාහනය සඳහාය.
    (2). මියගිය අයගේ ස්මාරක සඳහාය.
    (3). මියගිය අය වෙනුවෙන් යාතුකර්ම කිරීම සඳහාය.
    (4). දහනය සඳහා ඔක්සිජන් ලබා ගැනීමටය.

04. මෙරට වැසියෝ දහනයට ඔක්සිජන් වායුව අවශ්‍ය බවට දැනගෙන සිටියේ මීට වසර
    (1). 3250 කට පමණ පෙරය
    (2). 3600 කට පමණ පෙරය
    (3). 3800 කට පෙරය
    (4). 3900 කට පෙරය

05. ආදි මානවයා එළිමහන් ස්ථානවල පැල්පත් තනාගෙන ජීවත් වන්නට ඇතැයි පුරාවිද්‍යාඥයින් අනුමාන කරන ලද ස්ථානය වන්නේ,
    (1). බෙල්ලන්බැඳිපැලැස්ස ය
    (2). බෙරගල ය
    (3). රාවණා ඇල්ල ය
    (4). කිතුල්ගල බෙලිලෙන ය

06. කිතුල්ගල බෙලිලෙනෙන් සොයාගෙන නැති සාක්ෂියක් වන්නේ,
    (1). ගල්බැම්මකට අයත් කොටසකි
    (2). කැලෑදෙල් ඇට පුළුස්සා ආහාරයට ගත් බව
    (3). ප්‍රාග් ඓතිහාසික මානවයා ලුණු භාවිතා කළ බවට සාක්ෂි හමු වී ඇත
    (4). ගුරුගල් ආලේප කරන ලද මිනිස් ඇටසැකිලි හමු වී ඇත

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

07. යකඩ ලෝහ භාවිතය ඇරඹුණේ,

(1). ප්‍රාග් ඓතිහාසික යුගයේ ය
(2). පූර්ව ඓතිහාසික යුගයේ ය
(3). මුල් ඓතිහාසික යුගයේ ය
(4). ඉහත කිසිවක් නොවේ

08. ශ්‍රී ලංකාවේ නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි හමුවන යුගය වන්නේ,

(1). ප්‍රාග් ඓතිහාසික යුගයේ ය
(2). පූර්ව ඓතිහාසික යුගයේ ය
(3). මුල් ඓතිහාසික යුගයේ ය
(4). ගල් යුගයේ ය

09. පූර්ව ඓතිහාසික යුගයේ නිවාස ඉදිකළ බවට සාක්ෂි හමුවන ස්ථානය වන්නේ,

(1). උඩරංචාමඩම ය
(2). ඉබ්බන්කටුව ය
(3). බෙල්ලන්බැඳිපැලැස්ස ය
(4). බෙරගල ය

10. පූර්ව ඓතිහාසික යුගයේ මැටි බඳුන් සෑදීමට භාවිතා කරන ලද සරල යන්ත්‍රය වන්නේ,

(1). පීඩන ශල්කනයයි
(2). සකපෝරුවයි
(3). මොහොල්නගාය
(4). ලඹයයි

11. උඩරංචාමඩමෙන් හමු වූ මැටි බඳුනට සමාන මැටි බඳුනක් හමු වූ තවත් ස්ථානයකි,

(1). හල්දුම්මුල්ල
(2). කිතුල්ගල බෙලිලෙන
(3). බෙල්ලන්බැඳිපැලැස්ස
(4). ඉබ්බන්කටුව

12. මෙරට ඓතිහාසික යුගයට අයත් විශිෂ්ට කටයුත්තකි,

(1). මහ වැව් තැනීම
(2). මැටිඔරු සුසාන සෑදීම
(3). මැටි බඳුන් සෑදීම
(4). නිවාස ඉදිකිරීම

agaram.lk

13. පහත සඳහන් වැව් සෑදූ රජවරුන් සමඟ නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| i. ගිරිතලේ | A. I වන පරාක්‍රමබාහු රජතුමා |
| ii. හුරුලු වැව | B. II වන අග්බෝ රජතුමා |
| iii. පරාක්‍රම සමුද්‍රය | C. ධාතුසේන රජතුමා |
| iv. කලාවැව | D. මහසෙන් රජතුමා |

(1). DCBA
(2). BDAC
(3). BADC
(4). ABCD

14. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආරම්භයට හේතු වූ සාධකයක් නොවන්නේ,

(1). වියළි කලාපය ජල හිඟ ප්‍රදේශයක් වීම
(2). අවුරුද්දේ එක් කාලයකට පමණක් වැසි ලැබීම
(3). ජලය එක්රැස් කර තබා ගැනීමට ඇති වූ අවශ්‍යතාවය
(4). ශ්‍රී ලංකාවට වැඩි වැසි ලැබෙන ප්‍රදේශයක් වීම

15. වැව් ඉවුරේ ආරක්ෂාව සඳහා ජල මට්ටම පාලනය කිරීමට දායක වන වැවේ ප්‍රධාන අංගයක් ලෙස සැලකෙන්නේ,

(1). බිසෝකොටුව
(2). කළිඟුබැම්ම
(3). පිටවාන
(4). කුළුවැව

16. මින්නේරිය, ගිරිතලේ, කවුඩුලු සහ කන්තලේ යන වැව්වලට ජලය ගෙන යාම සඳහා ඉදිකළ ඇළ වන්නේ,

(1). ජය ගඟයි (2). මිනිපේ ඇළයි (3). යෝධ ඇළයි (4). ඇළහැර ඇළයි

17. වේගයෙන් හමන සුළං උපයෝගී කරගනිමින් යපස් උණු කිරීමේ තාක්ෂණය අතීතයේ පැවති බවට සාක්ෂි හමුවන්නේ,

(1). අලකොළ වැවෙනි (2). බෙරගලෙනි (3). සමනළ වැවෙනි (4). අලිගලෙනි

18. සීගිරියේ බටහිර උද්‍යානයේ දක්නට ලැබෙන ජලමල් ගණන,

(1). 14 කි (2). 03 කි (3). 04 කි (4). 02 කි

19. වජ්‍ර චුම්බටය යනු, ,

(1). අකුණුසැර ඇදගැනීමට රුවන්වැලි සෑය මුදුනේ සවිකොට ඇති ව්‍යුහයයි.

(2). දිවුල් මැලියම් තවරන ලද ලෝහ දූලකි.

(3). රියන් හතක් ගැඹුරට පොළොව හෑරීමයි.

(4). රුවන්වැලි සෑයේ අත්තිවාරමයි.

20. ක්‍රි.ව. 5 වන සියවසේ ඉදිකරන ලද ගණිතානුකූල ආකෘතියකට අනුව නිම කරන ලද නාගරික සැලැස්මක් සහිත විශිෂ්ට උද්‍යාන සංකීර්ණයකි,

(1). රන්මසු උයන
(2). සීගිරිය
(3). මහාමේඝ උයන
(4). ආලාහන පිරිවෙන් සංකීර්ණය

21. පණ්ඩුකාභය රජ දවස අනුරාධපුරයේ ඉදිකොට තිබූ මාතෘ ශාලා හැඳින්වූයේ,

(1). උපසග්ගරෝගනාස
(2). සොත්ථි ශාලා
(3). පසවන්තිනාමශාල
(4). සිවිකාශාලා

22. හෙළ වාස්තු විද්‍යා ගොඩනැගිලි නිර්මාණයේදී ඒවා පරිහරණය කරන්නන්ගේ ස්වස්ථතාව පිළිබඳව අවධානය යොමු කොට ඇති බවට දියහැකි හොඳම සාධකයකි.

(1). ආලාහන පිරිවෙන
(2). රන්මසු උයන
(3). සීගිරියේ උද්‍යානය
(4). රුවන්වැලි සෑය

23. විවිධ ආභරණ සැකසීමේ තාක්ෂණය පිළිබඳ නූතන රන්කරුවාට අභියෝග කළ හැකි සොයාගැනීමකි,

(1). අභයගිරියෙන් හමු වූ රන්තැල්ල

(2). උඩරංචාමඩමෙන් හමු වූ ලෝහ කුර

(3). ඉබ්බන්කටුවෙන් හමු වූ පබළු මාලය

(4). ජේතවන කැණීම්වලින් හමු වූ මල් කැටයම් 21 ක් සහිත තැල්ලක කොටස

24. අතීතයේ කිරිමඩු ශාන්තිකර්මය පැවති බවට සාක්ෂි ලැබෙන ස්ථානයකි,

(1). රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ගල්පාය ප්‍රදේශය

(2). දෙහිගහ ඇලකන්ද ප්‍රදේශයේය

(3). සීගිරියට නුදුරු අලකොළවැව ප්‍රදේශයේය

(4). අනුරාධපුර හොරිවිල ප්‍රදේශයේය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

25. වෙස්සගිරිය සෙල්ලිපියේ ''මොහොල් නගා'' යන පද දෙකෙන් කියවෙන්නේ,
(1). සොරොව්වේ ජලය පාලනය කරන දණ්ඩ වශයෙනි.
(2). ගලින් තැනූ ආයත චතුරස්‍රාකාර අවකාශයයි.
(3). මැටිබඳුන් ළිඳ තුළට බස්සවා එහි බිත්ති ආවරණය කිරීමයි.
(4). ඇළමාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කළ අයෙකි.

26. වැව් බැම්ම බාදනය වීමේ අනතුර වළක්වාලීමට ඉදිකර තිබෙන වාරි කර්මාන්ත නිර්මාණය හැඳින්වෙන්නේ කිනම් නමකින්ද?
(1). සොරොව්ව
(2). බිසෝකොටුව
(3). රළපනාව
(4). පිටවාන

27. ඇළමාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරියා හැඳින්වූයේ,
(1). බොජ්කපති නමිනි
(2). දකපති නමිනි
(3). බතගු නමිනි
(4). අධික නමිනි

28. විශාල වැව්වල ජලය පරිස්සමින් පිටතට ගැනීමට පුරාණ ඉංජිනේරුවන් විසින් නිර්මාණය කරන ලද වැවක අංගය හඳුන්වන්නේ,
(1). සොරොව්ව
(2). රළපනාව
(3). බිසෝකොටුව
(4). පිටවාන

29. පළමුවරට මෙරට විශාල වැව් ඉදිකිරීම සම්බන්ධයෙන් පුරෝගාමීව කටයුතු කළේ,
(1). වසභ රජතුමාය
(2). පරාක්‍රමබාහු රජතුමාය
(3). මහසෙන් රජතුමාය
(4). ධාතුසේන රජතුමාය

30. පෞද්ගලික ජල පරිහරණයේදී ජලයේ නියමිත ප්‍රමිතිය සහ සිසිලනය ආරක්ෂා කර ගැනීම සඳහා පුරාණයේ අනුගමනය කරන ලද විධික්‍රමයකි,
(1). වැව් ඉදිකිරීම
(2). ඌරාකැට ළිං ඉදිකිරීම
(3). පොකුණු ඉදිකිරීම
(4). උමං ජලමාර්ග සෑදීම

31. යපස් උණුකරන යකඩ උඳුන් හමුවන්නේ ලංකාවේ කුමන ස්ථානයෙන්ද?
(1). රත්නපුර සමනළ වැව ප්‍රදේශයෙන්ය
(2). සීගිරිය අලකොළ වැව ප්‍රදේශයෙන්ය
(3). අම්පාර රජගල පැත්තෙන්ය
(4). පතිරාජවෙල ප්‍රදේශයෙන්ය

32. සමනළ වැව යකඩ නිස්සාරණය කිරීමේ උඳුන් දැල්වීම සඳහා අඟුරු ලබාගෙන ඇත්තේ,
(1). තේක්ක ගස් පිළිස්සීමෙනි
(2). කළුවර ගස් පිළිස්සීමෙනි
(3). මරං ගස් පිළිස්සීමෙනි
(4). පොල්කටු පිළිස්සීමෙනි

33. අතීතයේ ''උසබ'' යන මිනුම භාවිතා කරන ලද්දේ,
(1). කාලය මැනීමටය
(2). බර මැනීමටය
(3). අවකාශය මැනීමටය
(4). දිගදුර මැනීමටය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

34. සැත්කම් සඳහා භාවිත කරන ලද ඉතා පැරණි ලෝහමය කතුරු කිහිපයක් සොයා ගන්නා ලද්දේ පහත කුමන ස්ථානයකින්ද?

(1). අභයගිරි විහාර සංකීර්ණයෙනි
(3). ආලාහන පිරිවෙන් සංකීර්ණයෙනි
(2). දැදිගම කොටවෙහෙර සමීපයෙනි
(4). ජේතවන කැණීමෙනි

35. පළමුවන පරාක්‍රමබාහු රජතුමා උපන් ස්ථානයේ තැනවූ ස්තූපය හැඳින්වෙන්නේ,

(1). සුතිඝර චෛත්‍යය නමිනි
(3). දෙමළ මහා සෑය නමිනි
(2). ජේතවනාරාමය නමිනි
(4). අභයගිරිය නමිනි

36. අවකාශය මැනීමට සකස් කරගත් මිම්ය.

(1). කිරිය, අමුණ, කරීසය
(3). ස්වර්ණ, පල, අංක
(2). විහ, ගුත්ජා, ධරන
(4). පරමාණු, ආංගුලය, වියත

37. (අ) කොටසට ගැළපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා සුදුසු පරිදි යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| i. දිග මැනීමට භාවිතා කළ කුඩාම ඒකකයකි | A. ගව්ව |
| ii. දිගදුර මැනීමට භාවිත කරන ලදී | B. හවජර |
| iii. බර මැනීමට භාවිතා කරන ලදී | C. පරමාණුවයි |
| iv. අවුරුදු යන වචනය සෑදී ඇත | D. ගුන්ජ |

(1). DCBA
(2). CADB
(3). DCBA
(4). CDAB

38. පහත සඳහන් වගන්ති අතුරින් නිශ්ශංකමල්ල රජතුමා සම්බන්ධ නිවැරදි වගන්තිය තෝරන්න.

(1). ගව්වෙන් ගව්ව ගාවුක කණු සිටුවීම
(2). රුවන්වැලි සෑය වීදුරු පබළුවලින් සැරසීම
(3). කිසිදු සතෙකු නොමැරිය යුතු බවට මාඝාත නීතිය පැනවීම
(4). ප්‍රථමවරට විශාල ප්‍රමාණයේ වැව් කරවීම

39. වෙළඳපොලක පාලනය පිළිබඳව නීති ඇතුළත් කර ඇති සෙල්ලිපිය කුමක්ද?

(1). සොරබොර වැව ටැම් ලිපිය
(3). තිස්සමහාරාම සෙල්ලිපිය
(2). මිහින්තලා පුවරු ලිපිය
(4). කළුදිය පොකුණ සෙල්ලිපිය

40. ශ්‍රී ලංකාවේ සැතපුම් 7 ක් පමණ දිග උස අඩි 44 කින් යුත් කෘතිමව සාදන ලද පස් බැම්මක් සහිත වැව වන්නේ,

(1). සීගිරි වැව යි
(3). පරාක්‍රම සමුද්‍රය යි
(2). මින්නේරිය වැව යි
(4). යෝධ වැව

## II කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. සපයන ලද ලංකා සිතියමේ පහත දැක්වෙන ස්ථාන ලකුණු කර දක්වන්න.

බෙල්ලන්බැඳිපැලැස්ස, කිතුල්ගල, බෙලිලෙන, උඩරංචාමඩම, සීගිරිය, කවුඩුල්ල වැව, මින්නේරිය වැව, හුරුලු වැව, යෝධ වැව, පදවිය වැව, කලා වැව, මහවැලිගඟ, අඹන්ගඟ, ගිරිතලේ වැව, කන්තලේ වැව, පරාක්‍රම සමුද්‍රය, ඉරනමඩු වැව, සොරබොර වැව, අනුරාධපුරය, පොළොන්නරුව, බලංගොඩ, දැදිගම (පුංඛගාම), මිනිපේ ඇළ, යෝධ ඇළ, කනදරා වැව, රාජාංගනය වැව.

02. පහත සඳහන් තොරතුරුවලට අදාළ පුද්ගලයන් හෝ ස්ථාන ලියා දක්වන්න.

A. සුතිඝර චෛත්‍යය ඉදිකරන ලද්දේ කුමන රජතුමා සිහිවීම පිණිසද?

B. මයිනහමක ආධාරයෙන් යකඩ උඳුන් දල්වීම සිදු කරන ලද්දේ කුමන ප්‍රදේශයේද?

C. ගවයින්ගේ ආරක්ෂාව සඳහා පැරණි කාලයේ සිදුකරන ලදැයි සැලකෙන ශාන්තිකර්මය කුමක්ද?

D. දැදිගම ඇත්පහන සෑදීමේ දී යොදාගෙන ඇති විද්‍යාත්මක මූලධර්මය කුමක්ද?

(ල.08)

03. පහත දැක්වෙන පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ). A. මෙම රූපයේ දක්වා ඇත්තේ කුමක්ද?
B. එය පිහිටා ඇති ජලාශය කුමක්ද?
C. මෙම අංගයෙන් සිදුකරන කාර්යයන් ලියන්න.
D. මෙම සොරොව්වෙන් මතුකරගත් දේ කුමක්ද?



(ආ). A. මෙම පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය කුමක්ද?
B. මෙය පිහිටා ඇති ප්‍රදේශය කුමක්ද?
C. මෙම සෑදීමට යොදාගත් ද්‍රව්‍ය කුමක්ද?
D. මින් හෙළිවන විද්‍යාත්මක සිද්ධාන්තය කුමක්ද?



(ඇ). A. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
B. මෙය සොයාගන්නා ලද ස්ථානය කුමක්ද
C. මෙය සෑදීමට යොදාගෙන ඇති ලෝහය කුමක්ද?
D. මෙය ඉදිකර ඇත්තේ කුමන රජතුමාගේ උප්පත්තිය සිහිවීම පිණිසද?



(1 × 4 = 4)


agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

04. (අ). ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුගයේ මානවයා නිවාස ඉදිකර ජීවත්වී ඇති බවට සාධක හමුවන ස්ථාන 03 ක් ලියා දක්වන්න. (ල.03)

(ආ). පූර්ව ඓතිහාසික යුගයේ මානවයා ඉතා උසස් තත්වයේ මැටි බඳුන් නිපදවීමට අනුගමනය කරන ලද ක්‍රමවේද 4 ක් ලියා දක්වන්න. (ල.04)

(ඇ). විද්‍යාත්මක අදහස්වල මුල් අවස්ථා 02 ක් ලියා ඒවා පැහැදිලි කරන්න. (ල.05)

(ඈ). රුවන්වැලි සෑයේ අත්තිවාරම සැකසීමේදී අනුගමනය කළ ක්‍රමවේදය සවිස්තරව පැහැදිලි කරන්න. (ල.06)

05. (අ). අනුරාධපුර පොළොන්නරු යුගයට අයත් පහත සඳහන් ගෘහ නිර්මාණ සඳහා උදාහරණය බැගින් ලියන්න.

A. පොකුණක්

B. ස්තූපයක්

C. රජමාලිගයක් (ල.03)

(ආ). පුරාණ කාලයේ යකඩ නිස්සාරණය කිරීමේ තාක්‍ෂණය පැවති බවට සොයාගෙන ඇති අවස්ථා 2 ලියා ඒවා පැහැදිලි කරන්න. (ල.03)

(ඇ). සීගිරියේ නගර හා උද්‍යාන නිර්මාණයේ විශිෂ්ටත්වය සැකෙවින් පැහැදිලි කරන්න. (ල.05)

06. (අ). පහත සඳහන් වැව් සෑදූ රජවරු A, B, C අනුපිළිවෙලින් නම් කරන්න.

A. මින්නේරිය වැව

B. බසවක්කුලම වැව

C. පදවිය වැව (ල.03)

(ආ). පහත A, B, C, D යටතේ දක්වා ඇති වැවක අංගවලින් කෙරෙන කාර්යයන් එක බැගින් ලියන්න.

A. රළපනාව

B. වැව් බැම්ම

C. බිසෝකොටුව

D. සොරොව්ව (ල.04)

(ඇ). ස්වභාවධර්මයට අයත් භෞතික තත්වය මැනගැනීමට සමත් ක්‍රමවේදයක් අතීතයේ පැවති බවට උදාහරණ 3 ක් දෙමින් පැහැදිලි කරන්න. (ල.05)

(ඈ). වැව් බැම්මේ ශක්තිමත්භාවය රැකගැනීමට අනුගමනය කර ඇති ක්‍රමවේදය ලියා දක්වන්න. (ල.06)

*සැකසුම: එම්.ජී.එස්. දිල්රුක්ෂි කුමාරි මිය*


Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

Agaram.LK - Keep your dreams alive!



Agaram.LK - Keep your dreams alive!